රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය
பொது நிர்வாக, மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் சனநாயக ஆட்சி பற்றிய அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION, PROVINCIAL COUNCILS, LOCAL GOVERNMENT AND DEMOCRATIC GOVERNANCE

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

| දුරකතන / தொலைபேசி / Telephone | ෆැක්ස් / தொலைநகல் / Fax | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site |
|---|---|---|---|
| (94) 011- 2696211-13 | (94) 011- 2695279 | secretary@pubad.gov.lk | www.pubad.gov.lk |

| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| PA/CS/POLICY/වා.ස්.මා.2015 | | 2015.01.27 දින. |

අමාත්‍යාංශ ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>2015 වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම</u>**
**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය, රජයේ භාෂා පරිවර්තක සේවය,</u>**
**<u>ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය,</u>**
**<u>කාර්යාල සේවක සේවය, ඒකාබද්ධ රියදුරු සේවය</u>**

ඒකාබද්ධ සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් අභියාචනා කිරීම සහ 2015 වර්ෂය සඳහා වූ ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වන දිනය පිළිබඳව උපදෙස් දෙමින් නිකුත් කරන ලද මගේ සමාංක හා 2014.11.27 දිනැති ලිපියට ඔබගේ කාරුණික අවධානය යොමු කරවනු ලැබේ.

02. එම ලිපියේ 04 වන ඡේදයේ දක්වා ඇති පරිදි, 2015 වර්ෂය සඳහා වූ ස්ථාන මාරු නියෝග එහි සඳහන් ආකාරයටම 2015.02.02 දින සිට ක්‍රියාත්මක විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

03. පැවති අමාත්‍යාංශ අහෝසිවීමෙන් හෝ සංශෝධනයන්ට ලක්වීමෙන් කිසියම් ස්ථාන මාරුවක් ක්‍රියාත්මක කිරීමේ දී ගැටළු සහගත තත්ත්වයක් මතු වේ නම් ඒ සම්බන්ධයෙන් සුදුසු පිළියම් යෙදීම සඳහා ලිඛිතව මා වෙත දැන්වීමට ද කටයුතු කළ යුතුය.

**කේ.වී.පී.එම්.ජේ. ගමගේ**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්